# රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## **BPH 22513/22613** - බෞද්ධ ආචාර විද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. බටහිර දාර්ශනික ඉගැන්වීම්වල සදාචාර ධර්ම අගය කිරීම සඳහා යොදාගන්නා ලද මූලධර්ම බෞද්ධ සදාචාර ධර්ම පද්ධතියෙහි අන්තර්ගතව ඇත් දැයි පරීක්ෂා කරන්න.

02. "සදාචාර ධර්මයන්හි අන්තර්ගත ප්‍රමාණාත්මක (Normative) හා විස්තරාත්මක (Descriptive) ලක්ෂණ බෞද්ධ සූත්‍ර දේශනාවන්හි ද අන්තර්ගත වේ." අදාළ මූලාශ්‍ර ඇසුරින් පෙන්වා දෙන්න.

03. වෛදික සම්ප්‍රදායයන්හි මෙන් සදාචාර ධර්මයන්හි පැහැදිලි විකාශයක් ශ්‍රමණ සම්ප්‍රදාය තුළ ද දැක ගැනීමට නොලැබෙන්නේ දැයි විමසන්න.

04. පින සංසාරගත ජීවිතය යහපත් කරගැනීම සඳහාත් කුසලය විමුක්තිය සාක්ෂාත් කරගැනීම සඳහාත් උපස්ථම්භක වන ආකාරය සූත්‍ර දේශනා ඇසුරින් ප්‍රකට කරන්න.

05. බෞද්ධ ඉගැන්වීම් උභයාර්ථ සාධනයෙහි ලා කෙතෙක් දුරට උපයෝගී වන්නේ දැයි ප්‍රකට කරන්න.

06. ස්වච්ඡන්දතාව හඳුන්වා බෞද්ධ ස්වච්ඡන්දතාව සදාචාර සංවර්ධනයෙහි ලා කෙතෙක් දුරට උපයෝගී වන්නේ දැයි සාකච්ඡා කරන්න.

07. සදාචාරාත්මක සමාජයක් ගොඩනැංවීමෙහිලා බුදුසමය අනුදත් පුනර්භව සංකල්පය කෙතෙක් දුරට උපස්ථම්භක වේදැයි ප්‍රකට කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා තුනක් (03) ක් පිළිබඳ ප්‍රමාණවත් විස්තර සපයන්න.

    i. ත්‍රි ශික්ෂා
    ii. පාරමිතා
    iii. පඤ්චශීල ප්‍රතිපදාව
    iv. සංසාරය හා නිර්වාණය
    v. ස්වර්ථය හා පරාර්ථය
    vi. කුසලා කුසල මිනුම් දඬු

@@@@@@@@@

43